**දමන ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**--------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 11 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමණාකරණ වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට දමන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### (අ) ගිණුම්කරණ අඩුපාඩුව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i). හිඟුරාණ සති පොළ ගොඩනැගිල්ලේ වියදම වූ රු.11,494,037 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | ගිණුම් ගත කර නොතිබුණු රු.11,494,037.16 ක් වටිනා ඉදිකරන හිඟුරාණ සතිපොළ ඉදිරිපිට කඩ කාමර 14 කින් යුත් දෙමහල් ගොඩනැගිල්ලේ මේ වන විට වටිනාකම 2019 ජුනි මස ගිණුම් ගත කරන ලදී. |
| (ii). පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ හෙළගම්පුර කොම්පෝස් අංගනයේ ගබඩාකාමරය සඳහා දරන ලද වියදම රු.1,279,813 ක් රු.1,104,958 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | හෙළගම්පුර කොම්පෝස්ට් අංගනයේ ගබඩාකාමරය ඉදිකිරීමේ වියදම සම්බන්ධ ලිපිගොනු පරීක්ෂා කර බලා 2019 ජුනි මාසයේදී අදාළ මුදල ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |

### (ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i). 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මුද්දර ගාස්තු | අයකර ගැනීමට කටයුතු කළ යුතු | 2011-2017 වර්ෂය වෙනුවෙන් 2018.12.31 දිනට අය විය යුතු මුදල රු.92,260.00 (සාධන පත්‍ර |

| | |
|---|---|
| වශයෙන් ලැබිය යුතු වේ. රු.92,260 ක මුදල සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගාස්තු හා 1% මුද්දර ගාස්තු අඩු කර) ක් වේ. මෙම හිග මුදල් සම්බන්ධව ඉල්ලීම් ලිපි යොමු කර ඇති අතර 2017 ජූලි/ අගෝස්තු මාසයන්ට අදාළව රු.33460.00 ක මුදලක් 2019.04.22 දින DPS/1503 මගින් ලැබී ඇත. |
| (ii). 2016 වර්ෂයට පෙර සිට අයකර ගැනීමට වරිපනම් බදු වශයෙන් කටයුතු කළ යුතු අයවිය යුතුව තිබූ වේ. රු.982,479 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2016 වර්ෂයට පෙර වරිපනම් ලේඛන නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණි. නමුත් අවසන් ගිණුම් හි වරිපනම් හිගය ලෙස රු.1,316,920 ක ශේෂයක් තිබුණ ද එම සම්පූර්ණ මුදල සම්බන්ධ තොරතුරු අප සතුව නොමැති බැවින් වරිපනම් අය කරනු ලබන්නේ අප සතු තොරතුරු පදනම් කර ගෙනය. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.1,695,443 ක වත්කම් විෂයයන් 05 ක් හා රු.87,637 ක වගකීම් විෂයයන් 01 ක් සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතු වේ. | දක්වා ඇති සියළු ගිණුම් වල ඇති ශේෂයන් සඳහා අප සතුව ඇති යම් ලේඛණයන් වේ නම් ඒවා පරීක්ෂා කර බැලීමටත් ලේඛණයන් නිසි පරිදි පවත්වා ගෙන යාමටත් කටයුතු කරනු ලැබේ. |

## 1.4 අනුකූල නොවීම

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති,රීති සහ රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ** | | | |
| (i) 139 (1) වගන්තිය | වරිපනම් බදු පැනවීමට යටත් දේපලක වටිනාකම තක්සේරු කිරීමට හැකිවනු පිණිස වාර වාර්තා කැඳවීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේදී වරිපනම් ප්‍රදේශ වලට යටත් දේපල සඳහා වාර වාර්ථා කැඳවීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ii) 140 (1) වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියලු නිශ්චල දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | සියලු දේපල නව තක්සේරුවකට කටයුතු කරමින් පවතී. |
| (iv) 159 වගන්තිය | 2009 සිට 2018 දක්වා කාල පරිච්ඡේදය තුල සභාව විසින් බදු දී තිබුණු කඩකාමර 27 කින් රු.547,902 ක් වූ හිඟ කඩ කුලිය අයකර ගෙන නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ලිඛිතව මෙන්ම වාචිකව ද දැනුවත් කර මෙම හිඟ වාරික අය කර ගැනීමට කටයුතු කරනු ඇත. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| ----------------- රීති 217 | ප්‍රාදේශීය සභාව සතු හා සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා ඉඩම් පවරාගෙන තක්සේරු වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. | රීති වල සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. | ප්‍රාදේශිය සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා ඉඩම් හා දේපල පවරා දීමට පියවර ගන්නා ලෙස අවස්ථා කිහිපයකදී ඉල්ලීම් කර ඇතත් මේ සම්බන්ධයෙන් දමන ප්‍රාදේශීය ලේකම් විසින් එම කාර්ය ඉටු නොවීම නිසා තක්සේරු කර ඉදිරි කටයුතු කිරීමට නොහැකිව ඇත. |
| (ඇ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** ----------------- | | | |
| (i) මු.රෙ. 104(3),(4) | 2018 වර්ෂයේදී අනතුරට පත්වූ වාහන 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙම වාහනයේ අනතුරු සම්බන්ධව මූලික පරික්ෂණය සිදු කිරීම සඳහා ප්‍රධාන කළමනාකරණ සහකාර, කාර්මික නිළධාරි, හා ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරයෙක් ඇතුළත් කර පරික්ෂණ මණ්ඩලයක් පත්කර අදාළ දිනය දැනුම් දුන් අතර කිහිප අවස්ථාවකදීම අදාළ මන්ත්‍රි වරයා පරික්ෂණය සඳහා සහභාගිවීම සිදු නොවීම නිසා පරික්ෂණය එදින සිදු කිරීමට නොහැකි වූ අතර ඉන්පසුව එය අතපසු විය. ඉදිරියේදී මෙවැනි අතපසුවීම් නොමැතිව කටයුතු කරන බවට වැඩිදුරටත් දන්වා සිටිමි.. |
| (ii) මු.රෙ. 110 | ප්‍රාදේශීය සභාව විසින් හානි හා පාඩු ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ වන විට හානි හා පාඩු ලේඛනයක් පවත්වා ගෙන යනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | **2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | වාහන හා යන්ත්‍රෝපකරණ 02 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහනය පිළිබඳව පරීක්ෂාවක් කළ යුතු වේ. | ඉදිරියේදී ඉන්දන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය
----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,338,954 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,941,878 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය
----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 420,907 | 420,907 | 583,052 | 15,038,069 | 420,906 | 420,907 | 87,672 | 1,711,451 |
| කුලී ආදායම | 3,144,754 | 3,072,888 | 2,939,581 | 525,899 | 472,626 | 2,975,376 | 3,038,364 | 403,902 |
| බලපත්‍ර ගාස්තු | 900,000 | 1,114,780 | 1,114,780 | 83,750 | 1,222,184 | 1,345,000 | 1,630,654 | 83,750 |
| වෙනත් ආදායම් | 3,843,500 | 9,426,655 | 5,868,388 | 958,407 | 3,456,983 | 1,222,500 | 258,091 | 2,200,518 |

**2.2.2** **වරිපනම් හා බදු**

-------------------

**(අ)** **වරිපනම් බදු**

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2007 වර්ෂයේ වරිපනම් තක්සේරුව පදනම් කරගෙන වරිපනම් අයකිරීම සිදුකර තිබුණි. හිඟ ආදායම් ලේඛනය අනුව 2018 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් රු.1,316,920 ක් වුවද හිඟ ශේෂය අයකර ගැනීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි. | ලේඛන අනුව හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිගහිටි වරිපනම් ශේෂය රු.1316920 ක් 2018 අවසන් ගිණුම් වල පෙන්නුව ද සභාව සතුව ඇති තොරතුරු අනුව හිඟ අයකර ගෙන ඇත. |

**(ආ)** **අක්කර බදු**

-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට පැවති නොගෙවූ අක්කර බදු රු.230,850 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | හිඟ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2014.12.31 දිනට අවසන් මූල්‍ය ප්‍රකාශන රු.230850 ශේෂයක් පෙන්නුම් කරන ලද අතර මේ සම්බන්ධව මුදල් අය කර ගැනීමක් සිදු නොවේ.<br>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(3) වගන්තිය අනුව ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් 5 ට අඩු එහෙත් හෙක්ටයාර් 1ට අඩු නොවන අවස්ථාවේදී පමණක් වාර්ෂික අක්කර බද්දක් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව රු.50.00 අය කළ හැකි බව සඳහන්ව ඇත. මේ වන විට මුළු බලප්‍රදේශයේ ඇති සියළු උක් වගා කරන ඉඩම් අක්කර 02 කැබැලි වලට බෙදා වෙන් කර ඇත. එම නිසා අක්කර බද්දක් එම ඉඩම් වලට අය කල නොහැක. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1** **කාර්ය සාධනය**

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගතයුතු වේ. | ප්‍රධාන කාරණා සම්බන්ධ අතුරු ව්‍යවස්ථා බල ප්‍රදේශයට අදාළ පරිදි කිහිප අවස්ථාවක් සකස් කර පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළද මේ සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම සිදු කර නැත. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කල යුතු වේ. | ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරනු ඇත. |

(ඇ) අත්හැර දැමූ කර්තව්‍යන්

| | කර්තව්‍ය | 2018 දෙසැම්බර් 31 දක්වා වැය කළ මුදල (රු.) | නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| i. | දැයට කිරුළ 2013 සංචාරක නිවාසය ඉදිකිරීම | 1,444,162 | අත්තිවාරම් දමා කණු සඳහා අවශ්‍ය කම්බි යොදා ඉදිකිරීම් නවතා ඇත. | ඉතිරි ඉදිකිරීම් කටයුතු නිමකර භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කළ යුතු වේ. | දැයට කිරුළ 2013 සංවර්ධන වැඩසටහන යටතේ රු.මිලියන 08 ක වියදමින් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. එහෙත් එවකට පැවති ප්‍රාදේශීය සභාව මේ සම්බන්ධයෙන් දක්වන ලද විරෝධතාව හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අතරමග නවතා ඇත. නැගෙනහිර පළාතේ ප්‍රධන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2019 වසරේ අයවැය මඟින් ප්‍රතිපාදන වෙන්කර දීමට තීරණය කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| ii. | දමන ප්‍රාදේශීය සභාව යටතේ ප්‍රජා ශාලාව ඉදිකිරීම උක්සිරිපුර/ සීතාපුර | 39,900 | ප්‍රාදේශීය සභා අරමුදල යටතේ 2015 දෙසැම්බර් 18 වන දින ඉදිකිරීම ආරම්භ කළ ගොඩනැගිල්ලේ අත්තිවාරම් පමණක් දමා ඇත. | ඉතිරි ඉදිකිරීම් කටයුතු නිමකර භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කළ යුතු වේ. | 2015 වර්ෂයේදී එවකට සිටිපු ප්‍රධාන අමාත්‍යතුමාගේ දැනුම්දීම මත ප්‍රාදේශිය සභාව ශක්තිමක් කිරීමේ වැඩසටහන යටතේ ප්‍රදේශයේ ප්‍රජාශාලාවක් ඉදිකිරීම ආරම්භ කර ඇතත් ඒ සඳහා ප්‍රතිපාදන අනුමත නොවීම නිසා ප්‍රාදේශිය සභා අරමුදලින් අත්තිවාරම පමණක් දමා ඉදිකිරීම් කටයුතු අතරමග නවතා ඇත. මේ සම්බන්ධයෙන් ඉදිරි ව්‍යාපෘතියකදී ඉදි කිරීම් අවසන් කිරීමට අදහස් කරමි. |

**(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030 පිළිබඳව දැනුවත් වී නොතිබුණි. | මේ සම්බන්ධයෙන් දැනුවත් විය යුතුය | මේ සම්බන්ධයෙන් දැනුවත් වීමක් නොමැත. |

## 3.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)2016 අගෝස්තු මාසයේදී රු.254,292 ක් වැයකර මාළු හා මස් වෙළඳාම් කිරීමට හිඟුරාණ සතිපොළ භූමියේ කඩ ඉදිකර තිබුණද, අදාල ඉදිකිරීම් නිසි සැලසුමකට අනුව සිදුකර නොමැති බැවින්, වෙළඳුන් විසින් සතිපොළ භූමියේ වෙනත් ස්ථාන වල මාළු හා මස් විකිණීම සිදුකරමින් තිබුණි. | එම ස්ථානය භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | මාලු හා මස් විකිණ්ම සඳහා සතිපොල පිටුපසට වන්නට මෙම කඩ කාමර ඉදිකර තිබුණද මාලු හා මස් විකිණීමේ වෙළඳුන්ට එම ස්ථානයේ එම කාර්ය ඉටු කර ගැනීමට අපහසු වී ඇත. මේ සඳහා වෙනත් ස්ථානයක සුදුසු පරිදි කඩ කාමර ඉදිකිරීමට සැලසුම් කර ඇත. ඉන්පසු එම ස්ථානය සභාවේ වෙනත් ආදායම් උත්පාදන ක්‍රමවේදයක් සඳහා යොදා ගැනීමට අදහස් කර ඇත. |
| (ආ)සභා බල ප්‍රදේශය තුළ වෙළඳ ආයතන 06 කින් ප්‍රදර්ශනය කර තිබුණු දැන්වීම් පුවරු 31 ක් වෙනුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.699,900 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පෙර වර්ෂයේ ලබා ගත් තොරතුරු පදනම් කර ගනිමින් 2018 වර්ෂයේ ලැබිය යුතු ස්ථිර දැන්වීම් පුවරු ගාස්තු රු. 699,900.00 ක් වන අතර මේ වන විට රු.560,300 ක් අය වී ඇත. |
| (ඇ)ප්‍රාදේශීය සභාව සතු දීර්ඝ කාලීනව බදු දී තිබුණ කඩකාමර 27 කින් 2009 සිට 2018 | හිඟ ආදායම් හා ප්‍රමාද ගාස්තු අයකර | මෙම හිඟ මුදල් හා දඩ මුදල් පිළිබඳ ඔහුන් ලිඛිතව දැනුම් කර අය කර |

| | | |
|---|---|---|
| දක්වා කාල පරිච්ඡේදයට අදාලව අයවිය යුතු රු.483,215 ක් හා ගිවිසුම් ප්‍රකාරව අයකර ගත යුතු 10% ක ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි. | ගැනිමට කටයුතු කළ යුතු වේ. | ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**3.3 මානව සම්පත් කළමණාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු සහ අතිරික්තය** | | |
| 2018 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 08 ක පුරප්පාඩු 10 ක් පැවතුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කල යුතු වේ. | අනුමත කාර්ය මණ්ඩලයේ පුරස්පාඩු 10 ක් ඇති අතර මෙම තනතුරු සඳහා බඳවා ගැනීම නැගෙනහිර පාළත් සභාව විසින් සිදු කළ යුතුව ඇත. |
| (ආ) විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් 2015 වර්ෂයේ සිට අයවිය යුතු රු.10,000 ක ණය ශේෂය අයකරගෙන නොතිබුණි. | අයනොවී පවතින සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 මැයි මස සිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් මාසිකව රු. 500.00 බැගින් අවකරණය කර අප වෙත එවනු ලැබේ. ඒ අනුව මේ වන විට රු. 9000.00 ක ශේෂයක් පවති. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නිශ්චිත කාලයක් සඳහන් නොකර බදු කරුවන් සමහ ගිවිසුම් ගත වී තිබුණු කඩ කාමර 42 ක් සම්බන්ධයෙන් ගිවිසුම්වල පවතින අඩුපාඩු සකස් කර නැවත ගිවිසුම් ගත වීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් වල පවතින අඩුපාඩු සකස් කර නැවත ගිවිසුම් ගත වීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රාදේශිය සභාව සතු කඩ කාමර වර්ෂ 03කට වැඩි කාලයක් සඳහා බද්දට දීමක් සිදු කර නොමැති අතර මෙම කඩ කාමර බදු දී ඇති අය වෙත නව ගිවිසුම් සඳහා කැඳවීම් කර ඇති අතර විවිධ හේතූන් දක්වා මේ දක්වා පැමිණ නැත.<br>කෙසේ වුවද මෙම දේපල ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට ඉදිරි කටයුතු කරනු ලබන අතර දේපල පවරා ගැනීමෙන් පසු නීතිමය පියවර ගැනීමට අදහස් කරයි. |
| (ආ)ඉහත කඩ කාමර වල කුලිය වර්ෂ 05 කට වරක් තක්සේරු කර නොතිබුණු අතර, දැනට පවතින කුලිය තක්සේරු කළ ආකාරය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | විධිමත් පරිදි කඩකාමර වර්ෂ 05 කට වරක් තක්සේරු කළ යුතු වේ. | මෙම කඩ කාමර නව තක්සේරුවක් සඳහා ඉදිරි කටයුතු කරමින් පවති. |

### 3.5 වත්කම් කළමණාකරණය

### 3.5.1 නඩත්තුව හා අලුත්වැඩියාව සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාහන 06 ක් දීර්ඝ කාලයක් තිස්සේ ගොඩනැගිලි පරිශ්‍රයේ ගාල්කර තිබුණු අතර, එම වාහන අලුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීම සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | වාහන අලුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම ආයතනයේ විශාල අලුත්වැඩියා සඳහා වාහන යොමු කර නොමැති අතර, එදිනෙදා කරන සුළු අලුත්වැඩියා සම්බන්ධයෙන් ලොග් සටහන් පොතේ සටහන් තබා ඇත. මේ වන විට විශාල අලුත්වැඩියා සඳහා යොමු කර ඇති LE 7498 අංක දරණ මහේනද්‍රා කැබ් රථය සඳහා පමණක් වෙනම ගොණුවක් පවත්වාගෙන යනු ලැබේ. |

### 3.5.2 වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු හිඟුරාණ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 02 ක් හා මුවංගල කඩ කාමර 02 ක් වර්ෂ 01 සිට වර්ෂ 10 ක පමණ කාල සීමාවක් දක්වා වසා තිබූ අතර, අය විය යුතු රු.220,600 ක හිඟ කුලී අයකර ගැනීමකට හෝ එම කඩකාමර නැවත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් උත්පාදනය කරන කාර්යයන් සඳහා යොදාගත යුතුය | මෙම කඩ කාමර සඳහා හිග කුළි ගෙවන ලෙස කිහිප වරක් ලිඛිතව දැන්වා ඇති අතර මේ සම්බනධව ඉදිරි නිත්‍යානුකූල කටයුතු කිරීමට පියවර ගනිමි. |

### 3.5.3 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විවිධ ආයතන මඟින් සභාවට ලබාදුන් වාහන 10 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන වල අයතිය සභාවේ නමට පවරා ගත යුතු වේ. | පවරා නොගත් වාහන 10 ක් ඇති අතර, එම වාහන වලින් වාහන 03 ක් දැනට ධාවන තත්ත්වයේ පවතී. ඉතිරි වාහන අලුත්වැඩියාව සඳහා විශාල මුදලක් වැය වන අතර, සභාවේ පවතින අඩු ආදායම් තත්ත්වය සමග එකවර මෙම වාහන අලුත්වැඩියා කිරීම අපහසු වී ඇති එබැවින් ඉදිරියේදී වාහන අලුත්වැඩියා කිරීමත් සමග පවරා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

**3.5.4 ප්‍රසම්පාදනය**

**-------------------**

**3.5.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

**-------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2006 මාර්තු 24 නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව 2018 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | 2006 මාර්තු 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ කර ඇති හෙයින්, මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට නොහැකි වී ඇත. |